සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

50 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ........................................ නාට්‍ය හා රංග කලාව - I කාලය : පැය 03යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

- **පහත සඳහන් පද්‍ය ඇසුරින් 01 - 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

A. රතදර සිරියා පරදන රූපෙට වටිනා
නිමල කොමළ තරුණී

B. හෙළ ගැඹුරුයි - පුත නොබලන්
හෙලවෙන කොට වැල් පාලම

C.
උඩින් උඩින් උඩු ගුවනට ගෙනාවා
බිමින් බිමින් බින්තැන්නෙන් ගෙනාවා
ඇතුන් අසුන් මිල කරලා ගෙනාවා
රිද්දි බිසව් හිස පීරන පනාවා

D. අත්තක පිපි මලක් ලෙසේ
මගේ පුතා මටත් උසේ

E. වඩිග පුර දේසෙන් - සත්දෙන බමුණු ඇවිදින්
කළ වඩිග පටුනෙන් - මෙසේ බමුණෝ යාග කරමින්

(1) ඉහත සඳහන් පද්‍ය ඇසුරින් රට යකුම ශාන්ති කර්මයේ එන ගායනය වන්නේ,
1. E 2. D 3. C 4. B

(2) නව නාට්‍ය ගීයක් වන්නේ,
1. B 2. A 3. C 4. D

(3) D පද්‍ය අයත් වන්නේ,
1. සූනියම් ශාන්ති කර්මයට. 2. රිද්දි යාගයට.
3. දහ අට සන්නිය. 4. නව නාට්‍යයට.

(4) B පද්‍ය අයත් වන්නේ,
1. රට යකුමට. 2. හුණුවටයේ කථාව නාට්‍යයට.
3. වැල් පාලම නාට්‍යයට. 4. කාලගෝල නාට්‍යයට.

(5) E පද්‍ය අයත් වන්නේ,
1. සූනියම් ශාන්ති කර්මයට. 2. රට යකුම ශාන්ති කර්මයට.
3. රිද්දි යාගයට. 4. දහ අට සන්නියට.

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

6) නෘත, නෘත්‍ය, නාට්‍ය යන සංකල්පය ඉදිරිපත් කළ දාර්ශනිකයා වන්නේ,
1. භරත මුණි 2. ඇරිස්ටෝටල් 3. බර්නාඩ් ෂෝ 4. ප්ලේටෝ

(7) දෘශ්‍ය කලාවකි.
1. මූර්ති 2. ඉඟිනළු 3. නර්තන 4. ටෙලි නාට්‍ය

(8) පාසලේ නිදහස් පරිසරයකට සිසුන් රැගෙන ගිය නාට්‍ය හා රංග කලා ගුරුතුමිය නිදහසේ ඒ මේ අත ඇවිදින්නට උපදෙස් දුන්නා ය. ඇය විසින් සිසුන් ලවා සිදු කරන ලද්දේ...
1. නිර්මිත චලනයකි. 2. තාලානුකූල චලනයකි.
3. ස්වභාවික චලනයකි. 4. සංචලනයකි.

(9) පහත සඳහන් ඒවා අතරින් රංග ක්‍රීඩාවක් වන්නේ,
1. මෝරා සහ මුහුද 2. බැලූනයකට හුලං ගැසීම
3. හිම කන්ද දිය වීම. 4. ඉටිපන්දම දිය වීම.

(10) ''නෘත්‍ය'' යනු?
1. රංගන මගින් කිසියම් අර්ථයක් හා භාවයක් දක්වෙන තාලාන්විත නැටුමකි.
2. සතර අභිනයම යොදා ගන්නා නැටුමකි.
3. කිසියම් කථා පුවතක් පාදක කරගෙන සතර අභිනය යොදාගෙන කරන්නකි.
4. අර්ථය ප්‍රකාශ නොකරන නර්තනයකි.

(11) ''ක්ෂණික නිරූපනය'' සඳහා භාවිත කරන තවත් නමකි.
1. එසැන නිරූපනය. 2. රූපන. 3. අනුකරණ. 4. අභිරූපන.

(12) කට හඬ අභ්‍යාස කිරීම සඳහා යොදාගත හැකි ග්‍රන්ථයකි.
1. මහා වංශය. 2. සකස් කඩ. 3. සැලලිහිණි සන්දේශය. 4. සිරිත් මල්දම

(13) ''ගල් ලෙන බිඳලා.....'' ගීය ඇතුළත් වන්නේ,
1. මූදු පුත්තු නාට්‍යයට 2. වන තාරාවා නාට්‍යයට
3. සිංහ බාහු නාට්‍යයට. 4. මනමේ නාට්‍යයට.

- අංක 14 සිට 18 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.

A 

B 

C 

D 

(14) 'ජන කරළිය' නාට්‍ය ක්ෂේත්‍රයට හඳුන්වාදුන් නාට්‍ය කරුවා වන්නේ,
1. A 2. C 3. D 4. C

(15) 'ගංගාවක් සපත්තු කබලක් සහ මරණයක්' නාට්‍යයේ නිර්මාණකරු වන්නේ,
1. B 2. C 3. D 4. A

(16) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'මනමේ' නාට්‍යයේ මනමේ කුමරු වූයේ,
1. B 2. C 3. D 4. A

(17) 'බෙර හඬ' නාට්‍යයේ නිර්මාණකරු වන්නේ,
1. A 2. C 3. B 4. D

(18) 'කුවේණි' නාට්‍යයේ පූරකගේ චරිතය රඟපෑ ශිල්පියා වන්නේ,
1. B 2. D 3. C 4. A

- අංක 19 සිට 23 දක්වා ප්‍රශ්නවලට **නොගැලපෙන** පිළිතුර තෝරන්න.

(19) පහත රට සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයක් වනුයේ,
1. සූනියම් ශාන්ති කර්මය. 2. රට යකුම.
3. දහ අට සන්නිය. 4. කිරි මඬුව.

(20) පහත සඳහන් වන්නේ හෙන්රි ජයසේනයන් නිර්මාණය කළ නාට්‍යයයි.
1. කුවේණි 2. ජනේලය 3. පුස්ලෝඩං 4. පව්කාරයෝ

(21) පහත දැක්වෙනුයේ කොහොඹා කංකාරී ශාන්ති කර්මයට අයත් නාට්‍යමය අවස්ථායි.
1. නානු මුරය 2. මුව මල විදීම 3. ගුරුගේ මාලාව 4. ඌරා යක්කම

(22) පහත දැක්වෙනුයේ දහ අට සන්නි ශාන්ති කර්මයේ උපත් කතාවේ එන චරිතයි.
1. සංඛපාල රජු. 2. වසවර්ති මාරයා.
3. ආයුපාල බිසව. 4. රාජ මුළු යකා.

- **අංක 23 සිට 26 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් තොරතුරු ඇසුරු කර ගන්න.**

| | | |
|---|---|---|
| A - නර්තන | E - මකර වලිගය | I - ගණිතමය රටාව |
| B - ලී කෙළි නැටුම | F - අඩව්ව | J - පසුබිම් වාදනය |
| C - අවධානය | G - ඔපෙරා | K - ගජගා වන්නම |
| D - බැලේ | H - නිදහස් අවකාශය | L - මීයෝ සහ පූසෝ |

(23) රංග ක්‍රීඩා හා සම්බන්ධ වන්නේ,
1. E L H 2. I E H 3. E L I 4. C L J

(24) තාලානුකූල චලන හා සම්බන්ධ වන්නේ,
1. C I A 2. C I J 3. H I A 4. I J A

(25) ප්‍රාසාංගික කලා හා සම්බන්ධ වන්නේ,
1. A D F 2. A G J 3. A D H 4. A D G

(26) 'නෘත්ත' හා සම්බන්ධ වන්නේ,
1. A B D 2. B F K 3. B K D 4. A D I

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(27) නාට්‍ය ගීත අයත් වන්නේ,
1. ආංගික අභිනයට. 2. වාචික අභිනයට. 3. ආහාර්ය අභිනයට. 4. සාත්වික අභිනයට.

(28) පහත සඳහන් කලාවන් අතර සජීවී කලාවක් නොවන්නේ,
1. ටෙලි නාට්‍ය. 2. ගීත නාට්‍ය. 3. ඔපෙරා. 4. මුද්‍රා නාට්‍ය.

(29) නාට්‍යක් නරඹන පුද්ගලයා හඳුන්වනු ලබන්නේ,
1. ශ්‍රාවකයා 2. පාඨකයා 3. ලේඛකයා 4. ප්‍රේක්ෂකයා.

(30) පහතරට සම්ප්‍රදායේ කාන්තාවන් වෙනුවෙන් ම කරන ශාන්ති කර්මය වන්නේ,
1. සන්නි යකුම 2. මැණික්පාල ශාන්තිය 3. ඔඩ්ඩිස යාගය 4. රිද්දි යාගය.

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| ක | ඩ | ග | ජ | ට |
|---|---|---|---|---|
| ස්වර්ණ හංස<br>සකල ජන<br>දියසේන නොපැමිණීම | ගබඩා කොල්ලය<br>මුව මල විදීම<br>යක්කම් පහ | කපුයක්කාරිය<br>දොළහ පෙළපාලිය<br>දරු නැලවිල්ල | රිද්දියාගය<br>සූනියම<br>දහ අට සන්නිය | සුභ සහ යස<br>ගඟන සරන කුරුල්ලනේ<br>සත සහ සත |

(31) කොහොඹා කංකාරියේ නාට්‍යමය පෙළපාලි ඇතුලත් වන්නේ,
1. ක 2. ග 3. ජ 4. ඩ

(32) ස්ව තන්ත්‍ර නාට්‍ය ඇතුලත් වන්නේ,
1. ක 2. ජ 3. ග 4. ට

(33) පහත රට ශාන්ති කර්ම ඇතුලත් වන්නේ,
1. ජ 2. ඩ 3. ක 4. ග

(34) බන්දුල ජයවර්ධනයන්ගේ නාට්‍ය නිර්මාණ අඩංගු වන්නේ,
1. ක 2. ග 3. ජ 4. ට

(35) රට යකුම ශාන්ති කර්මයේ ඇතුලත් අංග වේ.
1. ඩ 2. ජ 3. ග 4. ට

- **අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

(36) රතු හැට්ටකාරී නාට්‍යයේ එන ගීතයක් වන්නේ,
1. හතික වරෙව් කොල්ලනේ
2. දීකිරි දීකිරි
3. සෝබාව දේ
4. සත් සියක්

(37) පහත දැක්වෙනුයේ කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ උපත් කතාවේ එන චරිතයි.
1. රාහු අසුරේන්ද්‍ර, උෆරා, පඬුවස්දෙව් රජ.
2. රාහු අසුරේන්ද්‍ර, ගෝනා, පඬුවස්දෙව් රජ.
3. කුවේණි, උෆරා, සේරමාන රජු.
4. පත්තිනි දේවී, පාළඟ කුමරු, පඬුවස්දෙව් රජ.

(38) විශ්ණු දෙවි හා මැණික්පාල බිසව පිළිබඳ පුරාවෘත්තය ඇතුලත් වන්නේ,
1. රට යකුම ශාන්ති කර්මයේ.
2. සන්නි යකුම ශාන්ති කර්මයේ.
3. සූනියම් ශාන්ති කර්මයේ.
4. දහ අට සන්නි ශාන්ති කර්මයේ.

(39) ලූෂන් බුලත්සිංහල මහතා විසින් නිර්මාණය කරන ලද ගීතයක් වන්නේ,
1. කුමට ද සොබනියෙ.....
2. පුරහඳ පායා දිලෙන වැනි
3. සෝබාව දේ
4. ප්‍රේමයෙන් මන රංජිත වේ

(40) නාට්‍යයක් වේදිකාගත කිරීමේදී දෘශ්‍ය වන ශිල්පියෙකි.
1. නළුවා 2. අධ්‍යක්ෂවරයා 3. වේදිකා පරිපාලන 4. රංගභූමි පාලක

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

50 S II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
# First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : .......................................... නාට්‍ය හා රංග කලාව - II

වැදගත් :

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

- පහත සඳහන් පද්‍ය ඛණ්ඩය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සත් අවුරුද්දක් මෙහෙකර - ගන්ත මාගෙ අඹු සිඟිත්ත
සමඟ ආවෙ ගමට යන්න මං - මගෙ හාමුදුරුවො
සමඟ ආවෙ ගමට යන්න මං
මේ හොර දිගාටුවා - ගඟ ගැඹුරුයි කියලා
මහ ගජ බින්න දොඩාලා - මගෙ අඹුත් රැගෙන
පලා යන්න ගියේ මේ හොරා

01. (i) ඉහත සඳහන් නාට්‍ය ගීතය උපුටාගෙන ඇත්තේ කිනම් නාට්‍යයකින් ද? (ලකුණු 02)
(ii) මෙය ගායනා කරන චරිතය නම් කරන්න. (ලකුණු 02)
(iii) මෙහි ''මගෙ හාමුදුරුවො'' යනුවෙන් පවසන්නේ කාහට ද? (ලකුණු 02)
(iv) මෙය ගායනයේ දී වාදනය කරන අවනද්ධ භාණ්ඩය නම් කරන්න. (ලකුණු 02)
(v) පහත සඳහන් වදන්වල අර්ථය පැහැදිලි කරන්න.
- මෙහෙකර -
- ගජ බින්න - (ලකුණු 02)

(vi) මෙම ගීතය සඳහා සංගීතය නිර්මාණය කළ ශිල්පියා නම් කරන්න. (ලකුණු 02)

02. (i) නාට්‍යයක් යනු කුමක් ද? (ලකුණු 02)
(ii) කථාන්දරයක හා නාට්‍යයක දක්නට ලැබෙන අසමානතා හතරක් ලියන්න. (ලකුණු 04)
(iii) නාට්‍ය පෙළක දක්නට ලැබෙන ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) ප්‍රාසාංගික කලා යනු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) ප්‍රාසාංගික කලා හා දෘශ්‍ය කලා දෙක බැගින් ලියන්න. (ලකුණු 04)
(iii) සෙසු ප්‍රාසාංගික කලා අතර නාට්‍ය කලාවේ සුවිශේෂීතාව විස්තර කරන්න. (ලකුණු 06)

04. (i) රංග අභ්‍යාස යනු මොනවාද? (ලකුණු 02)
(ii) ඔබ ප්‍රගුණ කරන ලද රංග අභ්‍යාස හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)
(iii) ඔබ ප්‍රගුණ කරන ලද රංග අභ්‍යාසයක යෙදෙන අයුරු විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) නාට්‍යමය ලක්ෂණ අඩංගු පහතරට ශාන්ති කර්ම දෙකක් නම් කරන්න. ලකුණු 02)
(ii) එයින් එක් ශාන්ති කර්මයක ඇතුලත් නාට්‍යමය ලක්ෂණ අඩංගු පෙළපාලි දෙකක් නම් කරන්න. (ලකුණු 04)
(iii) ඉන් එක් පෙළපාලියක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ පිළිබඳ විස්තර කරන්න. (ලකුණ 06)

06. (i) සිංහල වේදිකා නාට්‍ය කලාවේ ප්‍රගමනය සඳහා කැප වූ නාට්‍ය කරුවන් දෙදෙනෙකු නම් කරන්න.(ලකුණු 02)
(ii) එම නාට්‍ය කරුවන්ගේ නිර්මාණ දෙක බැගින් ලියන්න. (ලකුණු 04)
(iii) ඉන් එක් නාට්‍ය කරුවෙකුගෙන් සිංහල නාට්‍ය කලාවට සිදු වූ සේවය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

07. පහත සඳහන් කථා සැකිල්ල පාදක කර ගනිමින් චරිත, සංවාද හා රංග විධාන සහිත නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල පිටවූ දා විශිෂ්ඨ ජයක් ලැබූ අරුණලී සාමාන්‍ය ලෙස සමත් වූ තම නිවුන් සොහොයුරිය වූ පියුමලී සමඟ පාසලින් නික්ම පා ගමනින් නිවසට ඒමට පිටත් වේ. ටික දුරක් විත් පිටුපස බැලූ අරුණලීට..........

(i) චරිත, සංවාද, රංග විධාන සහිත පෙළ නිර්මාණයට. (ලකුණු 04)
(ii) කුතුහලය හා ගැටුම් අවස්ථා සහිත වීම. (ලකුණු 04)
(iii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

50 S

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

## නාට්‍ය හා රංග කලාව - ප්‍රායෝගික පරීක්ෂණය

(01) නියමිත පෙළ (දික්තල කාලගෝල) පෙළ ඇසුරින් සිසුවා හුරු වී එන සංවාද කණ්ඩය. (ලකුණු 20)

(02) ගුරු අභිමතය පරිදි ලබාදෙන සංවාද කොටස (මෙය ලෝක ධර්මී විය යුතු ය. (තල මල පිපිලා හෝ විකෘති නාට්‍ය ඇසුරින්) (ලකුණු 20)

(03) නාට්‍ය ගීතයකට අනුව රංගනයේ යෙදීම. (ලකුණු 20)

(04) පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් එකක් තෝරාගෙන ක්ෂණික නිරූපනයක් කරන්න. (ලකුණු 20)
1. දේවාරූඪයෙන් ශාස්ත්‍ර කියන පුද්ගලයෙක්.
2. වසර කීපයකට පසුව දික්තලාට කාලගෝල හමු වී.
3. අකමැත්තෙන් පාසලට ගෙන යන දරුවෙක්.
4. කවට අන්දරේ තම බිරිඳ ඉදිරියේදී.
5. ගම දුව විවාහ කරගෙන ආ නරියා.

(05) කථාන්දරයක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම. (ලකුණු 20)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

50 S I-II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

### නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 1 | 21. | 1 | 31. | 2 |
| 02. | 2 | 12. | 2 | 22. | 2 | 32. | 4 |
| 03. | 3 | 13. | 3 | 23. | 1 | 33. | 1 |
| 04. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 1 |
| 05. | 1 | 15. | 1 | 25. | 4 | 35. | 3 |
| 06. | 1 | 16. | 4 | 26. | 2 | 36. | 2 |
| 07. | 1 | 17. | 2 | 27. | 2 | 37. | 1 |
| 08. | 3 | 18. | 4 | 28. | 1 | 38. | 3 |
| 09. | 1 | 19. | 4 | 29. | 4 | 39. | 3 |
| 10. | 1 | 20. | 3 | 30. | 4 | 40. | 1 |

## II කොටස

(01) (i) දික්තල කාලගෝල නාට්‍ය (ල. 02)

(ii) කාලගෝල (ල. 02)

(iii) මහෞෂධ පඬිතුමාට (ල. 02)

(iv) මද්දලය (ල. 02)

(v) මෙහෙකර - වැඩ කරලා, වැඩකාරකම් කරලා යනාදී සමාන වචනයකට

ගජ බින්න - බොරු (ල. 02)

(vi) පුන්‍යසේන ගුණසිංහ මහතා (ල. 02)

02. (i) නාට්‍යයක් යනු විශේෂයෙන් තෝරාගත් අවස්ථාවක් හෝ සිද්ධියක් තේමා කරගත් සංවාද හා චරිත ඇතුලත් ප්‍රබල පෙලක් සහිතව නරඹා රස විඳීමට තිබෙන්නකි. (ල. 02)

(ii)
- කථාන්දරය අසා රස විඳීම, නාට්‍ය නරඹා රස විඳීම.
- කථාන්දරය ඒකල වශයෙන් ඉදිරිපත් කරන අතර නාට්‍ය සාමූහික ක්‍රියාවලියකි.
- කථාන්දරය මුල සිට අගට දිවෙන අතර නාට්‍යයේ එසේ වීම අත්‍යාවශ්‍ය නැත.
- නාට්‍යයේ කාලය චරිත සීමිත වන අතර කථාන්දරයේ කාලය චරිත අසීමිත වේ.
- කථාන්දරයෙන් ලබාදෙන අර්ථයට වඩා ප්‍රබල ජීවිතාවබෝධයක් නාට්‍ය තුලින් ලබා දීම.
- කථාන්දරයට වඩා ප්‍රබල රස වින්දනයක් නාට්‍ය තුළින් ලැබීම..... ආදී පිළිතුරු හතරක් සඳහා. (ල. 04)

(iii)
- සංවාද
- රංග විධාන
- චරිත
- කතා ප්‍රවෘත්තියක් තිබීම
- ගැටුමක් තිබීම .... ආදිය ඇතුළත්ව විස්තර කිරීම සඳහා (ල. 06)

03. (i) ශිල්පියාගේ කටහඬ ඇතුළු ශරීරාංග මෙහෙයවමින් සජීවි ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ වේදිකාවක් මත සිදු කරනු ලබන කලාවක් ප්‍රාසාංගික කලා වේ. (ල. 02)

(ii)

| **ප්‍රාසාංගික කලා** | **දෘශ්‍ය කලා** |
|---|---|
| • නාට්‍ය | • චිත්‍ර |
| • සංගීත සංදර්ශන | • මූර්ති |
| • නර්තන ප්‍රසංග | • කැටයම් |
| • බැලේ | |
| • ඔපෙරා | |
| • ඉඟි නළු (මුද්‍රා නාට්‍ය) | |
| • ගීත නාට්‍ය | |

(ල. 04)

(iii)
- සජීවී බව
- රංග කාලයේ සීමා සහිත බව
- නිරූපනය කළ හැකිද යන්න පමණක් යොදා ගැනීම.
- වෙනත් කලාවන්ගේ එකතුවක් වීම.
- සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම.
- සක්‍රිය ප්‍රේක්ෂක සහභාගිත්වය.

- නැවත නැවත නිර්මාණය කළ හැකි වීම.
- ගබඩා කර තබාගත නොහැකි වීම.
- එක් වේලාවක එක් ස්ථානයක පමණක් රංගගත වීම...... යනාදි කරුණු ඔස්සේ විස්තර කර ඇත්නම් (ලකුණු 06)

04. (i) ආධුනික නළුවෙකු රංගනය හුරුවීම සඳහා කරනු ලබන අභ්‍යාස රංග අභ්‍යාස වේ. (ල. 02)

(ii)
- ශිථිලකරණ අභ්‍යාස
- දර්පණ අභ්‍යාස
- සංවේදන අභ්‍යාස
- ස්වසන අභ්‍යාස
- මානසික අභ්‍යාස
- කටහඬ අභ්‍යාස... යනාදි හතරක් ලිවීම සඳහා (ල. 04)

(iii) ඉහත නම් කරන ලද රංග අභ්‍යාසයක් කරන අයුරු විස්තර කිරීම සඳහා (ල. 06)

05. (i) සන්නි යකුම (දහ අට සන්නිය)
රට යකුම (රිද්දි යාගය)
සූනියම් යාගය (මැණික් පාල ශාන්තිය)
දෙකක් සඳහා (ල. 02)

(ii) **සන්නි යකුම**
- සූනියම් යක්ෂණියගේ අවතාර තුන
- පැදුරේ දූපවිල්ල
- පාලි නැටීම

**රට යකුම**
- නානුමුරය (දොළහ පෙළපාලිය)
- කපුයක්කාරිය

**සූනියම් යාගය**
- වඩිග පටුන

ශාන්ති කර්මය නම්කර පෙළපාලි දෙකක් ලිවීම සඳහා (ල. 04)

(iii) ඉන් එක් පෙළපාලියක් නම් කර එහි නාට්‍යමය ලක්ෂණ විස්තර කිරීම සඳහා (ල. 06)

06. (i) හෙන්රි ජයසේන, එදිරිවීර සරච්චන්ද්‍ර, සයිමන් නවගත්තේගම, පරාක්‍රම නිරි ඇල්ල, සුගතපාල ද සිල්වා, බන්ධුල ජයවර්ධන...... ආදී නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කිරීම සඳහා (ල. 02)

(ii) ඒ ඒ ශිල්පීන්ගේ නාට්‍ය දෙක බැගින් නම් කිරීමට (ල. 04)

(iii) ඉන් එක් අයෙකුගෙන් නාට්‍ය කලාවට සිදු වූ සේවය විස්තර කිරීම සඳහා. (ල. 06)

07. (i) චරිත, සංවාද, රංග විධාන සහිත පෙළ නිර්මාණයට (ල. 04)

(ii) කුතුහලය හා ගැටුම් අවස්ථා සහිත වීම. (ල. 04)

(iii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට. (ල. 04)